# ජාතික ආදායම හා වියදම

## සමස්ත උපනතීන්

1982 ස්ථාවර සාධක වියදම් මිල අනුව, 1992 වසර සඳහා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සියය 4.3 කින් වර්ධනයවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙය සියයට 4.6 ක් වූ පසුගිය වසරේ වර්ධන වේගයට වඩා තරමක පහළ මට්ටමක පැවතියද, වර්ධනය අත්පත් කරගත් පසුබිම හා සැලකීමේදී ඇගයිය යුතු තත්වයකි. 1992 දී ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙම වර්ධනය වාර්තා කෙරුනේ ලෝක ව්‍යාප්ත ආර්ථික අවපාතයක්ද, ආර්ථිකයේ ප්‍රාථමික අංශයන්ට අහිතකර ලෙස බලපෑ කාලගුණික තත්වයන්ද යටතේය. මෙය, වඩාත් විවිධාංගීකරණිත ආර්ථිකයක් කරා මෙහෙයවුනු ආර්ථික ප්‍රතිපත්තීන්ගේ වෙනස්කම් වල බලපෑමෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය තුල කෘෂිකර්මය සහ පතල් හා කැනීම් කටයුතු වලින් සමන්විත ප්‍රාථමික අංශය සතුව තිබූ සාපේක්ෂ වැදගත්කම යම් ප්‍රමාණයකට පහත වැටී ඇති බවට සාක්ෂි දරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාථමික අංශයෙහි පිරිහීමක් තිබුනද දිරිගන්වන සුළු වර්ධන වේගයක් පවත්වා ගැනීමට ආර්ථිකය සමත්ව ඇත. 1991 සියයට 4.6 ක් වූ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය හා සැසඳීමේදී 1992 දළ ජාතික නිෂ්පාදිතය සියයට 4.4 ක වර්ධනයක් වාර්තා කරයි.

ආංශික විශ්ලේෂනයන් විසින් හෙළිදරව් කරන පරිදි, ආර්ථික වර්ධනයට මූලික වශයෙන්ම හේතු සාධකව ඇත්තේ නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන්හි පුළුල් වීමයි. සමස්ත නිමැවුම් කර්මාන්ත අංශයෙහි වර්ධනය තවදුරටත් පවත්වා ගනිමින්, 1991 දී සියයට 6.8 ක් වූ මෙම අංශයෙහි වර්ධනය 1992 දී සියයට 9.0 දක්වා වැඩිවිය. මෙම වර්ධනය කර්මාන්ත නිෂ්පාදන අංශයේ එකතුවූ අගයෙහි වූ සියයට 13.0 ක සිත්ගන්නා සුළු වර්ධනයේ ප්‍රතිඵලයකි. සමස්ත නිමැවුම් කර්මාන්ත අංශයට හතරෙන් තුනක ආංශික දායකත්වයක් සපයන කර්මාන්ත නිෂ්පාදන අංශය තුල, ප්‍රධාන වශයෙන් ඇඟලුම් හා අනෙකුත් අපනයන මූලික කර්මාන්තයන් ප්‍රමුඛත්වයක් දරයි. මෙම අංශයේ ප්‍රසාරණය 1992 දී ශ්‍රී ලංකාවේ කාර්මික අපනයනයන්හි වූ වි.ගැ.හි. මිළගනන් අනුව සියයට 37 ක වැඩිවීම තුල පිළිබිඹු වේ.

ආර්ථික ක්‍රියාවලියෙහි වර්ධනය හා ස්ථායීතාවය විසින් ඉදිකිරීම් අංශයෙහි උත්පාතයක් ඇති කර තිබේ. 1992 දී ඉදිකිරීම් අංශයෙහි සියයට 7 ක මූර්ත වර්ධනයක් දැක්වෙන අතර, මෙය සියයට 3.1 ක් වූ 1991 වර්ධන වේගය හා සැසඳීමේදී දෙගුණයකටත් වඩා වැඩි වර්ධනයකි. ඉදිකිරීම් අංශය හැර සේවා අංශයෙහි වර්ධනය 1992 දී සියයට 5.3 කි. 1991 දී මෙම වර්ධනය සියයට 6.2 ක් ලෙස වාර්තා වුනි. මෙම අංශය තුල බැංකු හා අනෙකුත් මූල්‍ය සේවා, වෙළෙඳ, ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු යන අංශයන්හි සාපේක්ෂ ලෙස ඉහළ වර්ධන වේගයන් පැවතී ඇත.

ශ්‍රී ලංකා ආර්ථිකය විසින් අත්පත් කරගත් වර්ධන වේගයේ සුළු අඩු වීමට ප්‍රධාන වශයෙන්ම බලපා ඇත්තේ අහිතකර කාලගුණික තත්ත්වයන් හා ලෝක ව්‍යාප්ත ආර්ථික අවපාතයයි. 1991 දී සියයට 0.8 ක් වූ වර්ධන වේගයට පටහැනිව යමින්, 1992 දී කෘෂිකාර්මික අංශය සියයට 2.3 කින් සංකෝචනය වී ඇත. මෙය 1991 දෙසැම්බර් මාසයේ සිට 1992 අප්‍රේල් මාසය දක්වා වූ දැඩි නියඟයේ බලපෑමෙන් සිදු වූවකි. කෙසේවුවද, 1992 දී ධීවර උපඅංශයෙහි වූ සියයට 4.1 ක වර්ධනය, කෘෂිකර්ම අංශයේ සංකෝචනයේ බලපෑම අඩුකරමින්, සමස්ත කෘෂිකර්ම වනද්‍රව්‍ය හා ධීවර අංශයෙහි පහත වැටීම සියයට 1.5 කට සීමා කෙරිනි. 1991 දී සමස්ත කෘෂිකර්ම වනද්‍රව්‍ය හා ධීවර අංශයේ වර්ධනය සියයට 1.9 ක් විය. කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි පහත වැටීම කෘෂිකාර්මික අංශයට සෘජු ලෙස බලපෑවා පමණක් නොව, ඒ හා අනුබද්ධ අනෙකුත් අංශයන් වන අපනයන සැකසුම්, ප්‍රවාහන හා දේශීය වෙළෙඳාම යන අංශයන්හි වර්ධනය අඩාල කිරීමට ද හේතු වුනි. අඛන්ඩව පැවති ලෝක ව්‍යාප්ත ආර්ථික අවපාතය, මැණික් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය අපනයනයන්හි තවදුරටත් අඩුවීමක් ඇති කරමින් පතල් උප අංශයෙහි සැලකිය යුතු පහත වැටීමක් ඇති කළේය. කෙසේ වුවද, ඉදිකිරීම් අංශයේ වූ වර්ධිත ක්‍රියාකාරීත්වය කැනීම් කටයුතු වල එකතු අගයෙහි වැඩිවීම මෙහෙයවූ අතර, මෙය පතල් අංශයෙහි පහත වැටීම නිසා වූ අහිතකර

ප්‍රතිඵලයන් යම් පමනකට පිටු දැකීමට ඉවහල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත පතල් හා කැනීම් අංශයෙහි වූ පහත බැසීම සියයට 6 ක් පමණක් විය.

පවත්නා සාධක වියදම් මිළ අනුව 1992 දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 377 ක් ලෙස ඇස්තමේන්තු කොට තිබේ. මෙය රුපියල් බිලියන 328 ක් වූ පසුගිය වසරේ (1991) දළ ජාතික නිෂ්පාදිතය හා සැසඳීමේදී සියයට 14.8 ක වැඩිවීමකි.

1982 ස්ථාවර සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය 1991 දී රුපියල් බිලියන 132 සිට 1992 දී රුපියල් බිලියන 138 දක්වා වැඩිවෙමින් සියයට 4.4 ක වර්ධනයක් දක්වා ඇත. මේ අනුව ආර්ථිකයේ සමස්ත මිළ ගණන්හි වෙනස්වීම් දක්වන, දළ ජාතික නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකයේ වර්ධනය 1992 දී සියයට 10.0 ක් ලෙසට ගණන් බලා ඇත. මෙය 1991 දී සියයට 10.5 ක් වූ අගය හා සැසඳීමේදී සුළු පහත වැටීමකි.

1992 වසර සඳහා ශ්‍රී ලංකාවේ මැදි වසර ජනගහනය මිලියන 17.41ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මේ අනුව, පවත්නා සාධක වියදම් මිළ අනුව ඇස්තමේන්තු කළ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 21,641 (ඇ.එ.ජ.ඩො. 494) කි. මෙය පසුගිය වසරේ අගය වූ රු. 19,017 (ඇ.එ.ජ.ඩො. 460)ට වඩා සියයට 13.8 ක වැඩිවීමකි. 1992 දී මූර්ත ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම සියයට 3.5 ක් වේ.

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ජාත්‍යන්තර වෙළෙඳාමේ වැදගත්කම හා සැලකීමේදී වෙළෙඳ අනුපාතයේ වන යම් වෙනස්කමක් ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් කරයි. එබැවින්, රටෙහි මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි ක්‍රය ශක්තිය පිළිබඳ ඇස්තමේන්තුවක් වන මූර්ත ජාතික ආදායම වඩාත් වැඩි වැදගත්කමක් අත්පත්කර ගනියි. 1992 දී, වෙළෙඳ අනුපාතයෙහි සියයට 3.7 ක දියුණුවක් පෙන්නුම් කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූර්ත ජාතික ආදායම එනම් වෙළෙඳ අනුපාතයෙහි වෙනස් වීම්හි බලපෑමට අනුව ගලපන ලද මූර්ත දළ ජාතික නිෂ්පාදිතය සියයට 5.3 කින් වැඩි වී ඇත. මෙය 1991 දී සියයට 3.7 ක් වූ වර්ධනය හා සසඳන කළ සැලකිය යුතු තරම් වැඩි දියුණු වීමකි.

වියදම් අංශයෙන් බලන කළ, 1992 සඳහා ඇස්තමේන්තු ගත දළ දේශීය වියදම පවත්නා වෙළෙඳ මිළ අනුව රුපියල් බිලියන 459 කි. මෙය 1991 දී ඇස්තමේන්තුගත අගයට වඩා සියයට 11.9 ක වැඩිවීමක් වේ. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයේ නාමික වටිනාකම 1991 දී රුපියල් බිලියන 85 සිට, 1992 දී රුපියල් බිලියන 101 දක්වා සියයට 18.0 කින් වැඩිවිය. ඒ අතරම නාමික පරිභෝජන වියදම සියයට 10.3 කින් ඉහළ නැග ඇත. 1991 වසර හා බලන විට පුද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ පවත්නා මිළ අනුව වූ පරිභෝජන වියදම 1992 දී වඩා අඩු වේගයකින් වර්ධනය වුනි. 1992 සමස්ත පරිභෝජන වියදමෙහි මූර්ත වැඩිවීම සියයට 2.5 ක් වන අතර 1991 දී මෙම වැඩිවීම සියයට 6.7 කි.

ආයෝජන, දළ දේශීය නිෂ්පාදිතයයේ අනුපාතයක් ලෙස 1992 දී සියයට 23.7 කි. මෙය සියයට 22.9 ක් වූ පසුගිය වසරේ එම අනුපාතය හා සැලකීමේදී වැඩිදියුණු වීමකි. 1991 දී වාර්තා කෙරුනු සියයට 7.6 ක වර්ධනය හා සැසඳීමේදී 1992 දී වූ ශ්‍රී ලංකාවේ මූර්ත ආයෝජනය සියයට 9.0 කින් වැඩි වී ඇත. ඉදිකිරීම්, ප්‍රවාහන උපකරණ හා වෙනත් ප්‍රාග්ධන භාණ්ඩයන් හි සැලකිය යුතු ආයෝජනයක් කරමින් රටෙහි සමස්ත ආයෝජනයේ වැඩි ප්‍රමාණයක් තව දුරටත් උත්පාදනය කළේ පුද්ගලික අංශයයි. පසුගිය වසරට වඩා තරමක අඩු වේගයකින් වුවද, 1992 තුළ දී ද පොදුකාර්ය පහසුකම් සඳහා වන රාජ්‍ය ආයෝජනයන් තවදුරටත් කෙරීගෙන ගියේය.

1992 වසර සඳහා ඇස්තමේන්තු කළ දේශීය ඉතුරුම් ප්‍රමාණයේ නාමික අගය රුපියල් බිලියන 65 කි. දේශීය ඉතුරුම් අනුපාතය, එනම් දේශීය ඉතුරුම් හා වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය, 1991 දී සියයට 12.7 ක සිට 1992 දී සියයට 15.3 ක් දක්වා වැඩි විනි. මේ අතර 1991 දී සියයට 15.2 ක් වූ ජාතික ඉතුරුම් අනුපාතය ද 1992 දී සියයට 18.3 ක් දක්වා වැඩි වී ඇත. වැඩි වූ පුද්ගලික ඉතිරිකිරීම් ද අඩු වූ රාජ්‍ය නිර්ඉතිරිකිරීම් ද විසින් ඉතුරුම් වල වැඩිවීම උත්පාදනය කෙරුණි.

## ආංශීය ක්‍රියාකාරීත්වය

දළ ජාතික නිෂ්පාදිතයේ ආංශිය ක්‍රියාකාරීත්වය 1.6 සංඛ්‍යා වගුවෙහි දැක්වේ. 1991 දී මෙන්ම, රටෙහි ආර්ථික වර්ධනයට නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන් දායක වූ අතර කෘෂිකාර්මික සහ පතල් අංශයන්හි සෘණ වර්ධනයක් වාර්තා කෙරුණි.

සමස්ත කෘෂිකර්මය, වන ද්‍රව්‍ය හා ධීවර අංශයෙහි 1992 දී වාර්තා වූයේ සියයට 1.5 ක සංකෝචනයකි. මුළු දළ ජාතික නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශයෙහි සාපේක්ෂ වශයෙන් ඉහළ බරතැබීම ද, කෘෂි මූලික කර්මාන්ත, ප්‍රවාහන හා වෙළෙඳ ආදී වශයෙන් වූ අනෙකුත් අංශයන් සමඟ කෘෂිකාර්මික අංශයෙහි ඇති අන්තර් සම්බන්ධතා ද සැලකීමේදී 1991 වසරට වඩා 1992 දි ඇතිවූ දළ ජාතික නිෂ්පාදිතයෙහි අඩු වර්ධන වේගය සඳහා වූ මූලික වගකීම මෙම අංශය මත පැවරේ. දිගුකාලයක් තිස්සේ පැවැති නියඟයෙහි බලපෑම වැවිලි බෝග, වී, උක් හා අතිරේක ආහාර බෝග නිෂ්පාදනයන් තුළ පැහැදිලි ලෙසම දක්නට ලැබුනි. දිගුකාලීන නියඟයද, ඊට පසුව පැවති අධික වර්ෂාවද, තේ වගාව කෙරෙහි දරුණු ලෙස බලපෑ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තේ නිෂ්පාදනය විසිපස් වසරකටත් වඩා වැඩි කාලයක් තුළ වාර්තාගත කෙරුණු අඩුම මට්ටම දක්වා පහත වැටුණි. පොල් උප අංශයෙහි සියයට 9 ක වර්ධනයක් ඇති වුවද තේ උප අංශයේ එකතුකල වටිනාකමෙහි වූ සියයට 25.7 ක අඩුවීම හේතුකොට ගෙන සමස්ත වැවිලි කර්මාන්ත අංශයේ එකතුකල අගය සියය 8.1 කින් පහත වැටුනි. ප්‍රමාද වූ වර්ෂාව අඩු ඵලදායී යල කන්නයක් ඇති කළ අතර, 1992 යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 15 කින් පහත වැටුනි. මහ අස්වැන්න සතුටුදායක ලෙස සියයට 5 ක වැඩිවීමක් පෙන්නුම් කළ ද, යල කන්නයේ වූ පසුබෑම නිසා 1992 සමස්ත වී නිෂ්පාදනය සියයට 2 කින් පහත වැටුනි. අතිරේක ආහාර බෝග, සුළු අපනයන බෝග, පළතුරු, එළවළු, සත්ව නිෂ්පාදන, දුම්කොළ සහ උක් ආදී බෝග වලින් සමන්විත අනෙකුත් කෘෂිකාර්මික උප අංශයෙහි ආන්තික වර්ධනයක් දැක්විනි. අතිරේක ආහාර බෝග හා සුළු අපනයන බෝග යන අංශයන් දෙකෙහිම එකතු වූ අගය පහත වැටුනද, පළතුරු, එළවළු හා අනෙකුත් බෝග වල සිදු වූ වර්ධනයන් හේතුවෙන් මෙම පහත වැටීම මඟහරවා ගැනීමට හැකි වූ අතර එය මෙම උප අංශයෙහි වර්ධනයක් ඇතිවීම සඳහා හේතු විය.

1991 දී වාර්තා කෙරුනු සියයට 12 ක වර්ධනය හා සැසඳීමේදී 1992 දී ධීවර උප අංශයේ වර්ධනය සියයට 4.1 කි. වෙරළාසන්න ප්‍රදේශයන්හි ධීවර කටයුතු වල වූ ස්ථාවරත්වය නිසා මෙම අංශය තවදුරටත් වැඩිදියුණු වන බව 1992 ධීවර අංශයෙහි වූ මෙම වර්ධනය තුලින් පිළිඹිබු වේ.

පතල් හා කැනීම් අංශය තවදුරටත් සෘණ වර්ධනයක් දැක්වූ අතර, පසුගිය වසරේ වාර්තා කෙරුණු සියයට 10 ක් වූ සංකෝචනයට එරෙහිව 1992 වසරේ සංකෝචනය සියයට 6 ක් විය. උත්පාතනය වන ඉදිකිරීම් කර්මාන්තය කැනීම් උප අංශයෙහි එකතු කල අගය ඉහළ දමමින්, පහත වැටුනු ඛනිජ අපනයනයන් විසින් පතල් උප අංශය මත ඇතිකරන බලපෑම අඩු කිරීමට ඉමහත් සේවයක් කළේය.

නිමැවුම් කර්මාන්ත අංශය, රටෙහි කාර්මික සංවර්ධනය සඳහා වන සිය ශක්තිමත් දිරිගැන්වීම තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. දළ ජාතික නිෂ්පාදිතයේ මූර්ත වර්ධනයෙන් තුනෙක් එකකටත් වැඩි දායකත්වයක් සැපයුනේ නිමැවුම් කර්මාන්ත අංශයෙනි. 1991 දී සියයට 6.8 ක් වූ වර්ධන වේගය හා සැසඳීමේදී මෙම අංශයේ මූර්ත එකතු කල අගයේ වැඩිවීම සියයට 9 ක් විය. තේ සැකසුම් කර්මාන්තයේ එකතු කල අගයෙහි දක්නට ලැබුන සෘණ වර්ධනය නිසා නොවන්නට, මෙම අංශයේ වර්ධනය තවදුරටත් ඉහළ මට්ටමක පැවතීමට ඉඩ තිබුනි. නිමැවුම් කර්මාන්ත අංශයේ වර්ධනය ප්‍රධාන වශයෙන්ම සිදුවූයේ සියයට 13 ක මූර්ත වර්ධනයක් වාර්තා කෙරුනු කර්මාන්ත නිෂ්පාදන උප අංශයේ වර්ධනය තුලිනි. සුළු කර්මාන්ත උප අංශය සියයට 8 කින් වැඩි වී ඇති බවට ගණන් බලා ඇත.

## 1.6 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1990 - 1992

| අංශ | වටිනාකම (රුපියල් දශලක්ෂ) | | | ද. ජා. නි. හි ප්‍රතිශතය වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම රු. දශ ලක්ෂ | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990* | 1991* | 1992* | 1990* | 1991* | 1992* | 1991* | 1992* | 1991* | 1992* |
| 1. කෘෂිකර්මය, දැව ආදි වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 30,011 | 30,570 | 30,112 | 23.7 | 23.1 | 21.8 | 559 | -458 | 9.7 | -7.8 |
| 1.1 කෘෂිකර්මය | 25,729 | 25,941 | 25,338 | 20.4 | 19.6 | 18.3 | 212 | -603 | 3.7 | -10.2 |
| 1.1.1. තේ | 3,004 | 3,100 | 2,303 | 2.4 | 2.3 | 1.7 | 96 | -797 | 1.7 | -13.5 |
| 1.1.2. රබර් | 718 | 655 | 662 | 0.6 | 0.5 | 0.5 | -63 | 7 | -1.1 | 0.1 |
| 1.1.3. පොල් | 3,261 | 2,827 | 3,081 | 2.6 | 2.1 | 2.2 | -434 | 254 | -7.5 | 4.3 |
| 1.1.4. වී | 6,378 | 6,002 | 5,882 | 5.0 | 4.5 | 4.3 | -376 | -120 | -6.5 | -2.0 |
| 1.1.5. අනෙකුත් | 12,368 | 13,357 | 13,410 | 9.8 | 10.1 | 9.7 | 989 | 53 | 17.1 | 0.9 |
| 1.2 දැව ආදී වන ද්‍රව්‍ය | 2,030 | 2,107 | 2,149 | 1.6 | 1.6 | 1.6 | 77 | 42 | 1.3 | 0.7 |
| 1.3 ධීවර | 2,252 | 2,522 | 2,625 | 1.8 | 1.9 | 1.9 | 270 | 103 | 4.7 | 1.8 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 3,901 | 3,511 | 3,300 | 3.1 | 2.7 | 2.4 | -390 | -211 | -6.7 | -3.6 |
| 3. නිමැවුම් කර්මාන්ත | 22,427 | 23,949 | 26,106 | 17.7 | 18.1 | 18.9 | 1522 | 2157 | 26.3 | 36.7 |
| 3.1 අපනයන සැකසීම | 3,530 | 3,332 | 2,959 | 2.8 | 2.5 | 2.1 | -198 | -373 | -3.4 | -6.3 |
| 3.2 නිෂ්පාදන කර්මාන්ත | 17,085 | 18,708 | 21,140 | 13.5 | 14.1 | 15.3 | 1623 | 2432 | 28.0 | 41.3 |
| 3.3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත | 968 | 1,065 | 1,150 | 0.8 | 0.8 | 0.8 | 97 | 85 | 1.7 | 1.4 |
| 3.4 අනෙකුත් | 844 | 844 | 857 | 0.7 | 0.6 | 0.6 | - | 13 | - | 0.2 |
| 4. කැනීම් | 8,761 | 9.033 | 9,665 | 6.9 | 6.8 | 7.0 | 272 | 632 | 4.7 | 10.7 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 1,681 | 1,800 | 1,897 | 1.3 | 1.4 | 1.4 | 119 | 97 | 2.1 | 1.6 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 14,410 | 15,534 | 16,466 | 11.4 | 11.7 | 11.9 | 1124 | 932 | 19.4 | 15.8 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම | 26,497 | 28,556 | 30,215 | 21.0 | 21.6 | 21.9 | 2059 | 1659 | 35.6 | 28.2 |
| 7.1 ආනයනය | 9,422 | 10,826 | 11,974 | 7.5 | 8.2 | 8.7 | 1404 | 1148 | 24.3 | 19.5 |
| 7.2 අපනයනය | 3,060 | 3,210 | 3,576 | 2.4 | 2.4 | 2.6 | 150 | 366 | 2.6 | 6.2 |
| 7.3 දේශීය | 14,015 | 14,520 | 14,665 | 11.1 | 11.0 | 10.6 | 505 | 145 | 8.7 | 2.5 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල | 6,556 | 6,831 | 7,241 | 5.2 | 5.2 | 5.2 | 275 | 410 | 4.8 | 7.0 |
| 9. නිවාස අයිතිය | 3,705 | 3,761 | 3,795 | 2.9 | 2.8 | 2.7 | 56 | 34 | 1.0 | 0.6 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු | 6,355 | 6,304 | 6,449 | 5.0 | 4.8 | 4.7 | -51 | 145 | -0.9 | 2.5 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 4,940 | 5,355 | 5,714 | 3.9 | 4.1 | 4.1 | 415 | 359 | 7.2 | 6.1 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 129,244 | 135,204 | 140,960 | 102.2 | 102.3 | 102.1 | 5960 | 5756 | 103.0 | 97.8 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | (2,818) | (2,990) | (2,863) | -2.2 | -2.3 | -2.1 | -172 | 127 | -3.0 | 2.2 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 126,426 | 132,214 | 138,097 | 100.0 | 100.0 | 100.0 | 5788 | 5883 | 100.0 | 100.0 |

* තාවකාලිකයි

සටහන : 1992 ඇස්තමේන්තු, දැනට ලැබී ඇති රේගු දත්තයන් පදනම්කර ඇත.

1991 දී සියයට 3.1 ක් වූ මූර්ත එකතු කල අගයේ වර්ධනය හා සැසඳීමේදී 1992 දී සියයට 7.0 ක වර්ධනයක් දක්වමින් ඉදිකිරීම් අංශයේ උත්පාතයක් ඇතිවිය. රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබුනද, නේවාසික හා අනේවාසික ඉදිකිරීම්වල ප්‍රසාරණය ද ඇතුළුව පුද්ගලික අංශයේ ඉදිකිරීම් හි වැඩිවීම, රාජ්‍ය අංශයේ අඩුවීම මගහරවා ලීමට තරම් ප්‍රමාණවත් විය.

සමස්ත සේවා අංශය සිය ප්‍රසාරණය 1992 හි දී ද, තවදුරටත් පවත්වාගෙන ගොස් තිබුනි. 1992 වසරේදී සේවා අංශයේ වර්ධනය සියයට 5.3 ක් ලෙස ගණන් බලා ඇති අතර එය 1991 දී වූ සියයට 6.2 ක වර්ධනයට වඩා සුළු වශයෙන් අඩු වර්ධනයක් වේ. වර්ධනයෙහි මෙම අඩුවීම මූලික වශයෙන්ම ප්‍රාථමික අංශයන්හි, එනම් කෘෂිකාර්මික, පතල් හා කැනීම් අංශයන්හි සංකෝචනය නිසා ඇති වූවකි. සේවා අංශය තුල ප්‍රවාහන, පණිවුඩ හුවමාරු, වෙළඳ බැංකු හා මූල්‍ය සේවා යන අංශයන්හි ඉහළ වර්ධන අනුපාතයන් දක්නට විය. 1992 වසරේදී, ප්‍රවාහන, ගබඩාකිරීම් හා සේවා අංශයන් සියයට 6 ක වර්ධනයක් පෙන්වා ඇත. මූලික වශයෙන්ම ආනයන හා අපනයන වෙළෙඳාමේ සිදු වූ වැඩිවීම හේතුවෙන්, තොග හා සිල්ලර වෙළෙඳාම් අංශය, සියයට 5.8 ක සමස්ත වර්ධනයක් දක්වා ඇත. මෙම අංශයේ ප්‍රසාරණය, 1992 දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයෙන් සියයට 28 ක් සඳහා දායක වී තිබේ. නිමැවුම් කර්මාන්ත හා වෙළෙඳ අංශයේ ප්‍රසාරණය හේතුකොට ගෙන බැංකු රක්ෂණය හා නිශ්චල දේපල අංශය තවදුරටත් ප්‍රසාරණය වී ඇති අතර, 1991 දී සියයට 4.2 ක් වූ මූර්ත වර්ධනය හා සැසඳීමේදී, 1992 වසරේ එම අංශයේ වර්ධනය සියයට 6 ක් විය.

ආර්ථික ස්ථායීතාවයේ වර්ධනය හා ආරක්ෂක කටයුතු වඩාත් යහපත් අතට හැරීමත් සමඟ සංචාරක කර්මාන්තය තවදුරටත් ව්‍යාප්ත වී ඇත. 1982 වසරෙහි වූ වාර්තාගත සංචාරක පැමිණීම් සංඛ්‍යාවට ඉතා ආසන්න වෙමින්, 1992 වසර තුල ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව පසුගිය වසරට වඩා සියයට 23.9 කින් වැඩිවිනි. 1991 දී ඩී.ගැ.හි. මිලියන 116 ක් වූ, සංචාරක කර්මාන්තයෙන් ඉපැයූ විදේශ විනිමය ප්‍රමාණය 1992 දී ඩී.ගැ.හි. මිලියන 140 ක් දක්වා සියයට 20.6 කින් වැඩි වී ඇත. සංචාරක කර්මාන්තයේ වර්ධනය, අනෙකුත් සේවා අංශයෙහි දක්නට ලැබුන සියයට 6.7 ක වර්ධනය උදෙසා ද බොහෝදුරට ඉවහල් විය.

වියදම

1991 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද පවත්නා වෙළඳ මිල අනුව රුපියල් බිලියන 410 ක් වූ දළ දේශීය වියදම 1992 දී සියයට 12 ක වර්ධනයක් දක්වමින් රුපියල් බිලියන 459 ක් ලෙස ගණන් බලා ඇත. 1991 දී රුපියල් බිලියන 325 සිට 1992 දී රුපියල් බිලියන 359 දක්වා, පරිභෝජන වියදම පවත්නා මිළ යටතේ සියයට 10.3 කින් වැඩි විණි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 101 ක් ලෙස ගණන් බලා ඇති අතර, මෙය පසුගිය වසරට වඩා සියයට 18.0 ක වර්ධනයකි.

පුද්ගලික පරිභෝජනය හා රාජ්‍ය පරිභෝජනය යන කොටස් දෙකින් සමන්විත වන පරිභෝජන වියදම 1991 වසරට වඩා අඩු වර්ධන වේගයක් වාර්තා කරඇත. මෙම අඩුවීම වඩා විශාල වශයෙන් දක්නට ලැබෙනුයේ රාජ්‍ය පරිභෝජනය තුලය. 1992 වසර සඳහා ගණන් බලා ඇති පුද්ගලික පරිභෝජන වියදම රුපියල් බිලියන 319 කි. 1991 දී මෙම අගය රුපියල් බිලියන 288 ක් විය. පුද්ගලික පරිභෝජන වියදමේ වර්ධනය අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ ආනයනිත භාණ්ඩ කෙරෙහි, විශේෂයෙන්ම කල්පවත්නා පරිභෝජන භාණ්ඩ සඳහාවූ වියදමෙහි අඩු වර්ධනයයි. 1991 දී සියයට 29.7 කින් වැඩිවුනු ආනයනිත භාණ්ඩ සඳහා වන පරිභෝජන වියදම 1992 වසර තුල වැඩි වූයේ සියයට 9.8 කින් පමණි. ඊට පටහැනිව 1992 දී රුපියල් බිලියන 228 ක් වශයෙන් ගණන් බලා ඇති දේශීය භාණ්ඩ පරිභෝජනය, පසුගිය වසරේ වූ සියයට 13.9 ක වර්ධනය හා සසඳා බලනවිට සියයට 10.8 ක වර්ධනයක් වාර්තා කර ඇත. මේ අතර, 1991 වසරේදී සියයට 17.4 කින් වැඩි වූ රාජ්‍ය පරිභෝජන වියදම 1992 දී සියයට 8.8 කින් වැඩි විය.

## 1.7 සංඛ්‍යා සටහන
## සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1982 - 1992

| ශීර්ෂය | පවත්නා වෙළෙඳ මිළ අනුව (රු. දශ ලක්ෂ) | | | | 1982 මිළ අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1982 | | 1990 | | 1991 | | 1992 | | | |
| | 1982 | 1990* | 1991* | 1992* | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | 1990ට වඩා 1991 | 1991ට වඩා 1992 |
| 1. මුළු සම්පත් | 145,143 | 444264 | 517270 | 596313 | 145143 | 100 | 188904 | 100 | 202439 | 100 | 214534 | 100 | 7.2 | 6.0 |
| 1.1. වෙළෙඳ මිළ අනුව ද.දේ.නි. | 99,238 | 321783 | 372596 | 423289 | 99238 | 68 | 135655 | 72 | 141895 | 70 | 147996 | 69 | 4.6 | 4.3 |
| 1.2. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 45,905 | 122481 | 144674 | 173024 | 45905 | 32 | 53249 | 28 | 60544 | 30 | 66538 | 31 | 13.7 | 9.9 |
| 2. උපයෝගීකරණය | 145,143 | 444264 | 517270 | 596313 | 145143 | 100 | 188904 | 100 | 202439 | 100 | 214534 | 100 | 7.2 | 6.0 |
| 2.1 පරිභෝජනය | 87,468 | 275692 | 325098 | 358639 | 87468 | 60 | 116428 | 62 | 124205 | 61 | 127260 | 59 | 6.7 | 2.5 |
| 2.2. ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 30,279 | 70417 | 84206 | 99507 | 30279 | 21 | 31879 | 17 | 34367 | 17 | 37474 | 17 | 7.8 | 9.0 |
| 2.2.1. රජය | (4,866) | 12507 | 15838 | 16134 | 4866 | 3 | 4932 | 3 | 5667 | 3 | 5248 | 2 | 14.9 | -7.4 |
| 2.2.2. රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල | (25,413) | 57910 | 68368 | 83373 | 25413 | 18 | 26947 | 14 | 28700 | 14 | 32226 | 15 | 6.5 | 12.3 |
| 2.2.3. පෞද්ගලික අංශය | | | | | | | | | | | | | | |
| 2.3. තොග වෙනස් වීම් | 248 | 1038 | 950 | 1000 | 248 | - | 240 | - | 201 | - | 195 | - | -16.3 | -3.0 |
| 2.4. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 27,148 | 97117 | 107016 | 137167 | 27148 | 19 | 40357 | 21 | 43666 | 22 | 49605 | 23 | 8.2 | 13.6 |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තොග වෙනස්වීම් ද ඇතුලත්වන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1992 දී රුපියල් බිලියන 101 ක් ලෙස ගණන් බලා ඇති අතර මෙය 1991 වසරට වඩා සියයට 18.0 ක වැඩිවීමකි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පවත්නා වෙළෙඳ මිළ අනුව වූ දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස,. 1991 දී සියයට 22.9 සිට 1992 දී සියයට 23.7 දක්වා වැඩි වී ඇත. ආයෝජකයින්ගේ විශ්වාසීභාවයෙහි හා වර්ධන ශක්‍යතාවයෙහි වැඩිවීම මෙමගින් පෙන්නුම් කෙරෙයි.

1992 වසරේදී, රාජ්‍ය හා පුද්ගලික යන අංශයන් දෙකම සමාන වර්ධන ප්‍රතිශතයක් දැක්වුවද, 1992 දී ආයෝජනයන් සඳහා තවදුරටත් ප්‍රධාන දායකයා වූයේ පුද්ගලික අංශයයි. 1992 දී පුද්ගලික අංශයේ ආයෝජනයන් සියයට 21.7 කින් වැඩි වුනි. මෙය 1991 වසරේ වර්ධන වේගය වූ සියයට 17.8 ට වඩා තරමක් ඉහළ වර්ධනයකි. පුද්ගලික අංශයේ ආයෝජනය ප්‍රධාන වශයෙන් නේවාසික හා අනේවාසික යන අංශ දෙකෙහිම වූ ඉදිකිරීම් තුල ද, ප්‍රවාහන උපකරණ හා අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ තුල ද දක්නට ලැබුනි. 1991 දී සියයට 25.4 ක වැඩිවීම සමඟ සසඳා බලන කල 1992 දී රාජ්‍ය අංශයෙහි ආයෝජනය සියයට 1.9 කින් වැඩිවිය. ආර්ථිකයෙහි ප්‍රසාරනය සඳහා අත්‍යවශ්‍ය වූ මාර්ග සංවර්ධනය සහ විදුලි සංදේශ ආදී පොදු කාර්‍ය පහසුකම් ක්ෂේත්‍රය තුල රාජ්‍ය අංශයෙහි ආයෝජන වඩාත් සංකේන්ද්‍රනය වී ඇත.

විදේශීය සෘජු ආයෝජනයන් 1992 වසර තුලදී තව දුරටත් වැඩි වී තිබුනි. ආයෝජන මණ්ඩලය යටතේ වන ව්‍යාපාර තුල හා පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් තුල ද වූ ශුද්ධ විදේශීය සෘජු ආයෝජනයන් ගේ ප්‍රමාණය 1991 දී වි.ගැ.හි මිලියන 46 සිට 1992 දී වි.ගැ.හි. මිලියන 85 දක්වා සියයට 84 කින් වැඩිවිය.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

1992 වසරේ උපයෝජනය සඳහා ආර්ථිකය සතුව පැවති මුළු සම්පත් ප්‍රමාණය පසුගිය වසරට වඩා සියයට 15.3 ක වැඩිවීමක් පෙන්වමින් රුපියල් බිලියන 596 දක්වා වැඩි විය. රුපියල් බිලියන 79 ක් වූ මුළු වැඩිවීම රුපියල් බිලියන 51 ක් වූ දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම හා රුපියල් බිලියන 28 ක් වූ භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනයන්හි වැඩිවීමෙන් සමන්විතය. 1991 සියයට 18.1 ක් වූ වැඩිවීම හා සසඳන කළ 1992 දී භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනයන්හි වැඩවීම සියයට 19.6 කි.

ආර්ථිකය සතුව පවත්නා මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 60 ක් පරිභෝජනය සඳහා සියයට 17 ක් ආයෝජනයන් සඳහා ද, උපයෝජනය කෙරුනු අතර, ඉතිරි සියයට 23 අපනයන කෙරිණි. 1992 දී අපනයනය සියයට 28.2 කින් ඉහළ නැගුණු අතර, 1991 දී එහි වැඩිවීම සියයට 10.2 ක් විය. 1992 වසරේදී අපනයනයන් වැඩිවීමේ සීඝ්‍රතාවය ආනයනයන්ගේ වැඩිවීමේ සීඝ්‍රතාවයට වඩා සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතිනි. 1991 දී ආනයන වර්ධන වේගය අපනයන වර්ධන වේගය ඉක්මවා තිබුනි. 1991 දී සියයට 7.2 ක් වූ මූර්ත සම්පත් ප්‍රමාණයේ වැඩිවීමට එරෙහිව, 1992 දී එම වැඩිවීම සියයට 6.0 ක් විය.

1992 වසරේදී මූර්ත දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 9.0 කින් වැඩිවිනි. ප්‍රධාන වශයෙන් කරුනු ඉදිකිරීම් කටයුතු සහ ප්‍රවාහන අංශයෙහි කෙරුනු මූර්ත ආයෝජනයන්හි වැඩිවීම හේතුකොට ගෙන ප්‍රාග්ධන සම්පාදනයෙහි වර්ධනය සිදුවිය. 1992 දී මුළු පරිභෝජන ප්‍රමාණය වැඩිවූයේ 1991 දී වූ මූර්ත වැඩිවීමට වඩා අඩු වේගයකිනි. කෘෂිකර්මයෙහි වූ සංකෝචනය, කෘෂි ආදායම අඩු කිරීමට හේතු වූ අතර, මෙය පරිභෝජන වියදම වැඩිවීමේ වේගය අඩුවීම තුළින් පිළිබිඹු වෙයි.

## 1.8 සංඛ්‍යා සටහන

### ජාතික ඉතුරුම් 1990 - 1992 (පවත්නා වෙළෙඳ මිළ අනුව)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1990* | 1991* | 1992* |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය | 321,783 | 372,594 | 423,290 |
| 2. දේශීය ඉතුරුම් | 46,091 | 47,498 | 64,650 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම | -6.685 | -7,367 | -7,694 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 14,518 | 16,62 | 20,369 |
| 5. ජාතික ඉතුරුම් | 53,924 | 56,754 | 77,325 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) | 14.3 | 12.7 | 15.3 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) | 16.8 | 15.2 | 18.3 |

* තාවකාලිකයි